05-01-2019 උදෑසන මුරලි ඕම් ශාන්ති බාප්දාදා මධුබන්

**සාරය:** සුමිහිරි දරුවනි, තමන් ජීව යැයි සළකා, ඔබගේ සහෝදර ජීවයන්ට කතා කරන්න. නරක භූතයන් ඔබ තුළට ඇතුළු නොවන ලෙසින් ඔබගේ දෘෂ්ඨිය බොහෝ සේ ස්ථාවර කර ගන්න. යම් කෙනෙක් තුළ ඔබ නරක භූතයෙක් දකින විට, එම කෙනාගෙන් ඉවතට පියවර තබන්න.

**ප්‍රශ්නය:** පියාට අයත් වීමෙන් පසුව ද, දරුවන් අදේවවාදීන් සහ දේවවාදීන් වන්නේ කෙසේද?

**පිළිතුර:** 1) දේවවාදීන් යනු, දේවමය විනයන් අනුගමනය කරන, එමෙන්ම ජීව අවධානයෙන් සිටීමට උත්සාහ දරන අයයි. අදේවවාදීන් යනු දේවමය විනයන්ට පටහැනිව, නරක භූතයන්ගේ බලපෑමට හසු වී, එකිනෙකා සමඟ සණ්ඩු සරුවල් කරගන්නා අයයි. 2) දේවවාදී දරුවන්, තම යහළුවන් සහ නෑදැයින් ඇතුළුව, තම ශරීරය සහ ශාරීරික නෑදැයින්ගෙන් තම බුද්ධියේ යෝගාව බිඳ දමා, ඔවුන් සහෝදරයන් බව සළකයි. අදේවවාදී දරුවන් ශාරීරික අවධානයෙන් රැඳී සිටියි.

ඕම් ශාන්ති. පළමුවෙන්ම පියා ඔය දරුවන්ට විස්තර කරන්නේ ඕ දරුවනි, ශිව බාබා ඔබගේ පරම පියා, පරම ගුරුවරයා සහ පරම සත්ගුරු බව, සෑම විටෙකම ඔබගේ බුද්ධියෙන් සිහි කළ යුතුයි. මෙය නිසැකයෙන්ම ඔබගේ බුද්ධියට පළමුවෙන්ම ඇතුළු විය යුතුයි. මෙය ඔබගේ බුද්ධියට ඇතුළු වී තිබේද නැද්ද කියා, ඔබ එක් එක් කෙනා දන්නවා. ඔබගේ බුද්ධියේ සිහිපත් කිරීම තිබේ නම්, ඔබ දේවවාදියෙක් වන අතර, ඔබගේ බුද්ධියට එය ඇතුළු නොවන්නේ නම්, ඔබ අදේවවාදියෙකි. ඔවුන්ගේ ගුරුවරයා පැමිණ ඇති බව, ශිෂ්‍යයින්ගේ බුද්ධියට සැනෙකින් ඇතුළු වෙයි. ඔබ නිවසේ ජීවත් වන විට, ඔබට මෙය අමතක වෙයි. ඔවුන්ගේ උත්තරීතර බාබා පැමිණ ඇති බව, එම ආධ්‍යාත්මික කුල්මත්භාවයෙන් තේරුම් ගන්නේ ඉතාමත් ටික දෙනෙකි. ඔහු ගුරුවරයා මෙන්ම ඔබව ආපසු නිවහනට රැගෙන යන සත්ගුරු ද වන්නේය. ඔබට මෙය සිහි වන විට, ඔබගේ සතුටේ රසදිය කඳ ඉහළ නඟී. එසේ නැත්නම් දුක සහ වේදනා ඇති අපිරිසිදු ලොවෙහි, විවිධ සිතිවිලි වල ඔබ අසුන්ගෙන සිටියි. දෙවනුව, විනාශය සිදුවීමට තව කොපමණ කාලයක් තිබේදැයි ඔබගෙන් මිනිසුන් අසනවා. ඔවුන්ට කියන්න මෙය ඇසිය යුතු ප්‍රශ්නයක් නොවෙයි. පළමුව, අපට මෙය විස්තර කර දෙන කෙනාව හඳුනගන්න. පළමුවෙන්ම, ඔවුන්ට පියාගේ හැඳින්වීම ලබා දෙන්න. ඔබ තුළ මෙම පුරුද්ද තිබේ නම්, ඔබ ඔවුන්ට විස්තර කර දෙයි, එසේ නැත්නම් ඔබට අමතක වෙයි. තමන් ජීවයක් බව සළකන්න කියා, පියා ඔබට බොහෝ සේ කියයි. ජීව අවධාන දෘෂ්ඨියෙන් අන් අය දෙස බලන්න. කෙසේවෙතත් ඔබට එම දෘෂ්ඨිය පවත්වා ගැනීමට නොහැක. මෙය ඔබගේ බුද්ධියේ රැඳෙන්නේ ඉතාමත්ම සුළුවෙනි පවුමකින් පැන්සයක්වත් නොමැති තරම්. එය ඔබගේ බුද්ධියේ රැඳෙන්නෙම නැතිවා සේය. පියා ඔබට සාප කරනවා නොවෙයි. මෙම ඥානය ඉතාමත්ම උසස් බව පියා ඔබට විස්තර කරනවා. රාජධානියක් ස්ථාපනය වෙනවා දුප්පත් බවින් ඔබ ධනවත් වනවා. ධනවත් වන්නේ ටික දෙනෙක් පමණයි, දුප්පත් අය ද අංකානුරූපයි. අවසන් අංකයේ සිටින අයගේ බුද්ධියේ කිසි දෙයක් රැඳෙන්නේ නැත. එබැවින් පළමුවෙන්ම, ඔබ කෙනෙකුට විස්තර කරන විට, ශිව බාබාගේ ගුණධර්ම 32 පෙන්වන පිංතූරය භාවිත කරමින් ඔවුන්ට විස්තර කරන්න. පරම පියා, පරම ගුරුවරයා සහ සත්ගුරු ද බව එහි ලියා තිබේ. ඔබට විස්තර කර දෙන කෙනා, පරම පියාය යන විශ්වාසය ඇති විට, ඔබ තුළ කිසි සැකයක් ඇති නොවෙයි. පියා හැරුණු කොට අන් කිසිවෙකුට මෙම ස්ථාපනය සිදු කළ නොහැක. ස්ථාපනය සිදුවන බව ඔබ විස්තර කරන විට, මේ සෑම දෙයක්ම ඔබට විස්තර කර දෙන්නෙක් සිටින බව ඔවුන්ගේ බුද්ධියට ඇතුළු විය යුතුයි. රාජධානියක් ස්ථාපනය වන බව, කිසිම මනුෂ්‍යයෙකුට කිව නොහැක. එබැවින් පළමුවෙන්ම, ඔවුන් තුළ පියා කෙරෙහි ස්ථිර විශ්වාසයක් ඇති කරවන්න. දෙවි පියාණන් අපට උගන්වනවා. මේවා මනුෂ්‍යයින්ගේ උපදෙස් නොවෙයි මේවා දෙවියන්ගේ උපදේශයන්ය. නව ලොව, පියා විසින් අනිවාර්යෙන්ම ස්ථාපනය වෙයි. පැරණි ලොවෙහි විනාශය ගෙන ඒමත් පියාගේ කාර්යයයි. ඔවුන්ට මෙම විශ්වාසය ඇති වන තුරු ඔවුන් දිගින් දිගටම මෙසේ අසයි මෙය සිදුවන්නේ කෙසේද? මේ නිසයි ඔබ පළමුව, ශ්‍රීමත් පිළිබඳ කාරණය ඔවුන්ගේ බුද්ධිය තුළ රැඳවිය යුත්තේ, එවිට පමණයි ඔවුන්ට තව දුරටත් වටහා ගැනීමට හැකි වන්නේ. එසේ නොමැති නම්, මේවා මනුෂ්‍යයින්ගේ උපදෙස් බව ඔවුන් සලකයි. සෑම මනුෂ්‍යයෙකුගේම උපදෙස් වෙනස්ය. මනුෂ්‍යයින්ගෙන් එක් උපදේශයක් පමණක් තිබිය නොහැක. මෙකල, ඔබට උපදෙස් ලබා දෙන්නේ එක් අයෙක් පමණයි. ඔහුගේ ශ්‍රීමත් නිවැරදිව පිළිපැදීම ඉතාමත්ම අපහසුය. පියා පවසන්නේ ජීව අවධානයට පත් වන්න. ඔබ කතා

කරන්නේ ඔබගේ සහෝදරයන්ට බව සලකන්න, එවිට රණ්ඩු සරුවල් ඇති නොවෙයි. කෙනෙක් ශරීර අවධානයට පත් වූ විට, එම කෙනා අදේවවාදියෙක් යැයි සලකන්න. කෙනෙක් ජීව අවධානයෙන් නොමැති නම්, ඔහු අදේවවාදියෙකි. කෙනෙක් ජීව අවධානයට පත් වන්නේ නම්, එම කෙනා දේවවාදියෙක් යැයි සලකන්න. ශරීර අවධානය බොහෝ හානි සිදුකරයි. රණ්ඩු සරුවල් කිරීම සුළුවෙන් හෝ ඇති වන්නේ නම්, එම කෙනා අදේවවාදියෙක් යැයි සලකන්න. ඔවුන් පියාව හඳුනන්නේම නැත. කෝපයේ නරක භූතයා සිටියි නම්, එම කෙනා අදේවවාදියෙකි. පියාගේ දරුවන් තුළ නරක භූත තිබෙන්නේ කෙසේද? ඔවුන් දේවවාදීන් නොවෙයි. ඔවුන් පියාට ආදරෙයි කියා කොපමණ කීවත්, ඔවුන් දේවමය විනයන්ට විරුද්ධ අන්දමකින් කතා කරන්නේ නම්, ඔවුන් රාවණ්ගේ සමාජයට අයත් බව සැළකිය යුතුයි ඔවුන් සිටින්නේ ශරීර අවධානයෙන්. ඔබ යම් කෙනෙක් තුළ නරක භූතයෙක් දකින්නේ නම්, හෝ කෙනෙකුගේ ඊර්ෂ්‍යීය නරක නම්, ඔබ එම කෙනාගෙන් ඉවතට යා යුතුයි. ඔබ නරක භූතයෙක් ඉදිරියේ සිටගෙන සිටින්නේ නම්, එම නරක භූතයා ඔබ තුළට ඇතුල් වෙයි. නරක භූතයන් එකිනෙකා සමඟ රණ්ඩු කරගනී. කෙනෙක් තුළට නරක භූතයෙක් ඇතුළු වන්නේ නම්, එම කෙනා සම්පූර්ණ අදේවවාදියෙක් වෙයි. දේවතාවන් සියලුම ගුණධර්ම වලින් පිරිපුන්ය, නමුත් එම ගුණධර්ම නොමැති අය, අදේවවාදීන්ය. අදේවවාදීන්ට උරුමයක් හිමි වන්නේ නැත. සුළු අඩු පාඩුවක්වත් නොතිබිය යුතුයි, එසේ නැත්නම් බොහෝ දඬුවම් විඳින්නට සිදු වී, ඔබට පුරවැසියන් කොටසට අයත් වීමට සිදුවෙයි. ඔබ නරක භූතයන්ගෙන් ඈත්ව සිටිය යුතුයි. ඔබ නරක භූතයන්ට මුහුණ දී, එතැන සිටගෙන සිටියොත්, නරක භූතයන් පැමිණෙයි. ඔබ කිසිම විටෙක නරක භූතයෙකුට විරුද්ධ නොවිය යුතුයි. ඔබ ඔවුන් සමඟ වැඩිය කතා බහ නොකළ යුතුයි. පියා පවසන්නේ මෙය නරක භූතයින්ගේ ලෝකයයි. නරක භූතයින් ඔබව අත්හැර නොමැති නම්, දඬුවම් විඳීමට සිදුවී ඔබට තත්ත්වයක් හිමි කර ගැනීමට නොහැකි වෙයි. ඇත්තේ එකම යුද්ධය පමණයි. සමහරු ධනවත් වන අතර සමහරු දුප්පත් වෙයි. ධනවත් අයගේ ලෝකය තිබුණු අතර, එය දැන් දුප්පත් අයගේ ලෝකයයි. සෑම කෙනා තුළම නරක භූතයෙක් සිටියි. ඔබ නරක භූතයින් ඉවත් කරගැනීමට සම්පූර්ණ උත්සාහයක් දැරිය යුතුයි. බාබා ඔබට මුරලියේ බොහෝ දේ විස්තර කරයි. සෑම වර්ගයකම ස්වභාවයන් තිබේ, අහන්නවත් එපා! ඉතිං, ප්‍රදර්ශනයේදී ඔබ පළමුවෙන්ම පියාගේ හැඳින්වීම ලබා දිය යුතුයි. පියා බොහෝ මනහරයි. ඔහු අපව එවැනි දේවතාවන් බවට පත් කරනවා. මෙවැනි ගීයක් තිබේ මනුෂ්‍යයින්ව දේවතාවන් බවට වෙනස් කිරීමට, දෙවියන්ට වැඩි කාලයක් ගත වූයේ නැත. දේවතාවන් සිටියේ ස්වර්ණමය යුගයේය, එබැවින් එයට පෙර නිසැකයෙන්ම කලි යුගය තිබුණි. ඔය දරුවන්ගේ බුද්ධියේ දැන් ලෝක චක්‍රය පිළිබඳ ඥානය තිබේ. එහි, දේවතාවන්ට මෙම ඥානය නොතිබෙයි. ඔබ දැන් ඥානයෙන් පිරිපුන් වෙමින් සිටින අතර, ඉන්පසුව ඔබට තත්ත්වයක් ලැබුණු පසු, මෙම ඥානයට අවශ්‍යතාවයක් ඇති නොවෙයි. මේ, පරම්පරා 21කට, දිව්‍යලෝකයේ උරුමය ඔබට ලබා දෙන අසීමිත පියාය. එබැවින් ඔබ එවන් පියෙක්ව බොහෝ සේ සිහි කළ යුතුයි. බාබා සෑම විටෙකම විස්තර කරන්නේ ඔබට විස්තර කරන්නේ ශිව බාබා බව, සෑම විටෙකම සළකන්න. ශිව බාබා අපට මෙම රථය තුළින් උගන්වනවා. ඔහු අපගේ පියා, ගුරුවරයා සහ ගුරුය. මෙය අසීමිත ඉගෙනුමකි. ඔබට පෙර තිබුණේ පහත් බුද්ධි බව ඔබට වැටහෙනවා. මෙම කොලිජිය ගැන කිසිවෙක් නොදනී. එබැවින් ඔබ වෙන අයට විස්තර කරන විට, එය ඔවුන් තුළට තදින් කිඳා බැස යන අන්දමින්, පැහැදිලිව විස්තර කරන්න. මෙහි ක්‍රිෂ්ණා පිළිබඳ ප්‍රශ්නයක් නොමැත. ක්‍රිෂ්ණාගේ දිව්‍යමය ක්‍රියාවන් නොමැති බව පියා විස්තර කර දී තිබේ. මේවා ශිව බාබාගේ පමණයි. බ්‍රහ්මා, විෂ්ණු හෝ ශංකර්ගේ දිව්‍යමය ක්‍රියාවන් ද තිබිය නොහැක. දිව්‍යමය ක්‍රියාවන් ඇත්තේ, මනුෂ්‍යයින්ව දේවතාවන් බවට පරිවර්ථනය කරන කෙනාගේ පමණයි. ඔහු ලෝකය, දෙව්ලොව බවට පත් කරයි. ඔබ එම පියාගේ ශ්‍රේෂ්ඨ උපදෙස් පිලිපදියි ඔබ පියාගේ උදව්කරුවන්ය. පියා නොසිටින්නට, ඔබට කිසි දෙයක් කිරීමට නොහැකි වනු ඇත. ඔබ පැන්සයක්වත් නොවටිනා අයව සිට, දැන් පවුමක් වටිනා අය බවට පත් වනවා ඇත. ඔබ දරන උත්සාහයට අනුව, අංක පිළිවෙලට, ඔබට දැන් සෑම දෙයක්ම දැන ගන්නට ලැබී තිබේ. ඉතිං පළමුවෙන්ම පියාගේ හැඳින්වීම තිබේ. ක්‍රිෂ්ණා කුඩා දරුවෙකි. ස්වර්ණමය යුගයේදී ඔහුගේ අසීමිත ආධිපත්‍යය තිබිණි. ඔහුගේ රාජධානියේ අන් කිසිවෙක් සිටියේ නැත. එය දැන් කලි යුගය වන අතර, බොහෝ ආගම් තිබේ. මෙම එක් ආදි සනාතන දෙවි දේවතා ධර්මය ස්ථාපනය කළේ කවදාද කියා, කිසිම කෙනෙකුගේ බුද්ධියේ නොමැත. මෙයද ඔය දරුවන්ගේ බුද්ධියේ ඇත්තේ ඔබ දරන උත්සාහයට අනුව, අංක පිළිවෙලටයි. එබැවින් පළමුවෙන්ම ඔබ ඉතාම පැහැදිලිව පියාගේ වර්ණනාව විස්තර කළ යුතුයි. අප දන්නවා අපට මෙම හැඳින්වීම නිසැකයෙන්ම ලැබී තිබෙන්නේ පියාගෙන් බව. පියා පවසන්නේ මම සෑම කෙනෙකුටම විමුක්තිය පිරිනමන්නා ද වෙමි. මම සෑම චක්‍රයකදීම ඔය දරුවන්ට අවවාද කරනවා ඔබ ජීවයන් බව සළකා, මා සිහිපත් කරන්න, එවිට ඔය ජීව, අපවිත්‍ර බවින් පිවිතුරු වෙයි. ඔබ ජීව අවධානයට පත් වේවා! අන් අය ජීව ලෙස

සැලකීමෙන්, ඔබට සාපරාදි දෘෂ්ටියක් ඇති නොවෙයි. ශරීරය තුළින් ක්‍රියා සිදු කරන්නේ ජීවයයි මම ජීවයක්. මේ කෙනා ජීවයක්. ඔබ මෙය ස්ථිර කර ගත යුතුයි. ඔබ ආරම්භයේදී 100% පිවිතුරුව සිට, ඉන්පසුව අපවිත්‍ර වූ බව ඔබ දන්නවා. අඬ ගසන්නේ ජීවයි ඕ බාබා පැමිණෙන්න! ජීවය පිළිබඳ අවධානය ස්ථිර විය යුතුයි, තවද ඔබ අන් සියලුම නෑදෑයින් අමතක කළ යුතුයි. ජීවය වන මා, සුමිහිරි නිවහනේ වැසියෙක්මි. මම මෙහි පැමිණියේ කොටසක් රඟපෑමටය. මෙය වැටහෙන්නේ ඔය දරුවන්ට පමණයි. ඔහු සිහිපත් කිරීමේදී ඔය දරුවන් ද අංකානුරූපයි. දෙවියන් ඔබට උගන්වනවා, එබැවින් බොහෝ සතුට තිබිය යුතුයි. දෙවියන් අපගේ පියා, ගුරුවරයා මෙන්ම සත්ගුරුයි. ඔබ ඔහු හැරුණු කොට අන් කිසිවෙක් සිහි නොකරන බව කියයි. පියා පවසන්නේ ඔබගේ ශරීරයෙන් සහ ශාරීරික නෑදෑයින්ගෙන් මිදී, නිරතුරුවම මා පමණක් සිහි කරන්න. ඔබ සියලු දෙනාම සහෝදරයන්. සමහරු මෙය විශ්වාස කරන අතර, සමහරු නොකරයි. එබැවින් ඔවුන් අදේවවාදීන් යැයි සලකන්න. අපි ශිව බාබාගේ දරුවන්, එබැවින් අප පිවිතුරු විය යුතුයි. ඔබ පියාට අඬ ගසන්නේ බාබා පැමිණ අපව පිවිතුරු ලොවෙහි අධිපතියන් බවට පත් කරන්න. ස්වර්ණමය යුගයේදී, පිවිතුරු වීමේ ප්‍රශ්නයක් නොමැත. එම කෙනා ශිව බාබා බවත්, ඔහුගේ මාර්ගයෙන් ස්වර්ණමය යුගය ස්ථාපනය කරන බවත් පළමුවෙන්ම තේරුම් ගන්න. විනාශය සිදුවන්නේ කවදාද කියා මිනිසුන් විමසුවොත්, ඔවුන්ට කියන්න පළමුවෙන්ම ඇල්ෆා තේරුම් ගන්න. ඔබ ඇල්ෆා තේරුම් නොගත්තේ නම්, ඉන්පසුව එන ඒවා ඔබගේ බුද්ධියට ඇතුළු වන්නේ කෙසේද? සත්‍ය පියාගේ දරුවන් වන අප, කතා කරන්නේ සත්‍යයයි. අප මනුෂ්‍යයින්ගේ දරුවන් නොවෙයි අප ශිව බාබාගේ දරුවන්. දෙවියන් කතා කරයි. සියලුම සහෝදරයන්ගේ පියා වන්නේ එක දෙවියන්ය. මනුෂ්‍යයින්ට තමන් දෙවියන් යැයි කිව නොහැක. දෙවියන් අශාරීරිකයි. ඔහු පියා, ගුරුවරයා සහ සත්ගුරුය. කිසිම මනුෂ්‍යයෙකුට කිසිවෙකුට විමුක්තිය ලබා දිය නොහැක. මනුෂ්‍යයින්ට දෙවියන් විය නොහැක. බාබා පාරිශුද්ධකරුවාය. ඔබව අපවිත්‍ර කරවන්නේ රාවණ්ය. අන් සියලුම අය භක්ති මාර්ගයේ ගුරුන්ය. මෙහි එන අය දේවවාදීන් වන බව ඔබට වැටහෙනවා. ඔවුන් අසීමිත පියා වෙතට පැමිණ, ඔහු අපගේ පියා, ගුරුවරයා සහ ගුරුය යන විශ්වාසය ඇති වෙයි. ඔබ සියලුම දිව්‍යමය ගුණධර්ම සම්පූර්ණයෙන් වර්ධනය කර ගත් පසු, යුද්ධය ආරම්භ වෙයි. කාලයට අනුව, ඔබටම වැටහෙයි ඔබ කර්මතීට් තත්ත්වයට ළඟා වන බව. ඔබ තවමත් ඔබගේ කර්මතීට් තත්ත්වයට පත් වී නොමැත. දැන් කිරීමට විශාල වැඩ කොටසක් තිබේ. ඔබ බොහෝ දෙනෙකුට පණිවිඩය ලබා දිය යුතුයි. පියාගෙන් උරුමයක් හිමි කර ගැනීමට සෑම කෙනෙකුටම අයිතියක් තිබේ. යුද්ධය ඉතාමත්ම බලවත් අන්දමකින් ආරම්භ වෙයි. එවිට මෙම ආරෝග්‍යශාලාව සහ වෛද්‍යවරුන් ආදිය කොහෙත්ම ඉතිරි නොවෙයි. පියා පෞද්ගලිකවම ඔය දරුවන්ට විස්තර කරයි. ඔය ජීවයන් ඔබගේ උපත් 84හි කොටස් ශරීර හරහා රඟපායි. සමහරුන් උපත් 80ක් හෝ 70ක් ගනී. සෑම කෙනෙක්ම ආපසු යා යුතුයි. විනාශය සිදු විය යුතුයි. අපවිත්‍ර ජීවයන්ට ආපසු නිවහනට යා නොහැක. පිවිතුරු වීම සඳහා ඔබ අනිවාර්යෙන්ම පියා සිහි කළ යුතුයි. මේ සඳහා උත්සාහයක් අවශ්‍යයි. ඔබ උපත් 21කට දිව්‍යලෝකයේ වැසියන් විය යුතුයි. මෙය සුළු දෙයක් නොවෙයි. මිනිසුන් කියනවා මේ මේ කෙනා දිව්‍යලෝකයේ වැසියෙක් වී ඇති බව. ආ, ඇත්තද? නමුත් දිව්‍යලෝකය යනු කුමක්ද? ඔවුන්ට කිසි දෙයක් වැටහෙන්නේ නැත. ඔය දරුවන් බොහෝ සතුටින් සිටිය යුතුයි දෙවියන් අපට උගන්වා, අපව ලෝක අධිපතියන් බවට පත් කරනවා. එකක් සදාකාලික සතුට වන අතර, අනෙක තාවකාලික සතුටයි. ඔබ ඉගෙන ගන්නේ නැත්නම් හෝ අන් අයට උගන්වන්නේ නැත්නම්, සතුට තිබෙන්නේ කෙසේද? ඔබ රාක්ෂක ගති පලවා හැරිය යුතුයි. පියා බොහෝ සෙයින් විස්තර කරයි. කර්ම විදීම් බොහෝ සේ තිබේ. කර්ම විදීම් තිබෙන තාක් කල්, එය පෙන්නුම් කරන්නේ ඔබ තවමත් ඔබගේ කර්මතීට් තත්ත්වයට පත් වී නොමැති බවයි. ඔබ දැන් උත්සාහ දැරිය යුතුයි. මායාගේ කුණාටු නොපැමිණිය යුතුයි. පියා ඔබව මනුෂ්‍යයින්ගෙන් දේවතාවන් බවට බොහෝ වාර ගණනාවක් පරිවර්ථනය කර ඇති බවට ඔය දරුවන් තුළ විශ්වාසය තිබේ. මෙපමණක්වත් ඔබගේ බුද්ධියට ඇතුළු වන්නේ නම්, එය විශාල භාග්‍යයකි. මෙය අසීමිත පාසැලකි. එම අනෙක් පාසැල් කුඩා සීමිත පාසැල්ය. පියාට බොහෝ අනුකම්පාව දැනේ මම ඔවුන්ට විස්තර කරන්නේ කෙසේද? සමහරුන්ගෙන් තවමත් නරක භූතයන් ඉවත්වී නොමැත. හදවත් සිහසුනට නඟිනවා වෙනුවට ඔවුන් ඇද වැටෙයි. බොහෝ දෙනෙකුට යහපත ගෙන ඒමට දූවරුන් බොහෝ දෙනෙක් සූදානම් වනවා. අච්ඡා.

සුමිහිරි, ආදරණීය, බොහෝ කාලයක් තිස්සේ නැති වී සිට දැන් හමු වුණු ඔය දරුවන්ව ඔබගේ මව, පියා, බාප්දාදා සෙනෙහසින් සිහිපත් කර සුබ උදෑසනක් ප්‍රාර්ථනා කරයි. ආධ්‍යාත්මික පියාගෙන් ආධ්‍යාත්මික දරුවන්ට නමස්කාර.

**ධාරණය සඳහා සාරාංශය:**

1. දේවමය විනයන්ට විරුද්ධව කිසිම දෙයක් නොකරන්න. කෙනෙක් තුළ නරක භූතයෙක් සිටී නම් හෝ ඔහුට නරක දෘෂ්ඨියක් තිබේ නම්, එම කෙනාගෙන් ඉවත් වන්න. එම කෙනා සමඟ වැඩිය කතා නොකරන්න.
2. සදාකාලික සතුට අත්විඳීමට, ඉගෙනුමට සම්පූර්ණ අවධානය යොමු කරන්න. රාක්ෂක ගති ඉවත් කර ගන්න, දිව්‍යමය ගුණධර්ම ධාරණය කරගන්න, එමෙන්ම දේවවාදීන් වන්න.

**වරදානය:** ඔබ සෑම තත්පරයක සහ සෑම සිතිවිල්ලකම වැදගත්කම දැනගෙන, ඒ අනුව ඔබගේ රැස් කිරීමේ ගිණුම පුරවාගන්නා, බලවත් ජීවාත්මයක් වේවා.
සංගම යුගයේදී ඔබට සෑම මොහොතකදීම, අවිනාශී පියාගෙන් අවිනාශී ලැබීම් තිබේ. මුළු කල්පයෙන්ම, ඔබට මෙවන් භාග්‍යයක් හිමිවන්නේ මෙම එක කාලයේදී පමණක් වන අතර ඔබගේ පාඨය මෙය වන්නේ ඒ නිසයි 'දැන් නැත්නම් කිසිදා නොවෙයි.' ඔබ සිදුකළ යුතු කුමන හෝ ශ්‍රේෂ්ඨ කාර්යයන් තිබෙන්නේද, ඔබ එය දැන් කළ යුතුයි. ඔබට මෙම අවධානය තිබෙන විට, ඔබ කිසිම විටෙක ඔබගේ කාලය, සිතිවිලි හෝ ක්‍රියා අපතේ නොහරියි. ඔබගේ බලවත් සිතිවිලි තුළින්, ඔබගේ රැස් කිරීමේ ගිණුම පිරී ගොස්, ජීවාත්මය ශක්තිමත් වෙයි.

**පාඨය:** සෑම වචනයක සහ ක්‍රියාවක අසහාය බව වන්නේ, පවිත්‍රත්වයයි. සාමාන්‍ය බව, අසහාය බවට පරිවර්ථනය කරන්න.

***** ඕම් ශාන්ති *****

.

**බ්‍රහ්ම පියාට සමාන වීම සඳහා විශේෂ උත්සාහයන්.**

ලෞකිකත්වය තුළ, අලෞකික වීමේ අවධානය ඇති කරගන්න. ලෞකික අය සමඟ ජීවත් වන අතර, අප අන් අයගෙන් වෙනස්ය. ඔබගේ ජීව-අවධාන ස්වරූපයේ, ඔබ වෙනස් බව සලකන්න. ඔබගේ ක්‍රියාවන් ගෙන් වෙනස් වීම පහසුයි - ඒ නිසා ඔබ ලෝකයාගේ සෙනෙහසට බඳුන් වන්නේ නැත, නමුත් ඔබ සිරුරෙන් වෙන් වී ජීව අවධානයෙන් ක්‍රියා සිදුකරන විට, ඔබට සියලු දෙනාගේම සෙනෙහස හිමි වෙයි. මෙය අලෞකික ස්ප්‍රීතිය ලෙස හැඳින්වෙයි.